කොවිඩ් 19 සති පාසල

සබරගමුව

විෂය- ඉතිහාසය ශ්‍රේණිය - 09 ශ්‍රේණිය වාරය-III
සතිය - 01 සතිය

විශේෂ පුනරීක්ෂණ පැවරුම අංක - 01

- තෙවන වාරයට අදාළ විෂයකරුණු ආවරණය කිරීමට ලබාදෙන පැවරුම් ආරම්භයට පෙර පළමු හා දෙවන වාරයට අදාළ විෂය කරුණු ආවරණය වන ලෙස මෙය සකසා ඇත.
- පළමු හා දෙවන වාර වල අවසන්වූ පාඩම් ආවරණය වන ලෙස සැකසුන ප්‍රශ්නාවලිය

සිසුන්හට උපදෙස් -

- පහතින් දක්වා ඇති ප්‍රශ්න සඳහා තම සටහන් පොතෙහි පිළිතුරු සපයන්න.
- එහිදී ප්‍රශ්නය ලියා නැවත පිළිතුරු ලිවීම අත්‍යාවශ්‍ය වේ.
- මෙමගින් පසුගිය විෂය කොටස් නැවත ආවරණය කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රශ්නාවලිය -

1. ලංකාවට පැමිණි මුල්ම දූත කණ්ඩායම් දෙක කුමක්ද?
2. ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම හැඳින්වූ කෙටි නාමය කුමක්ද?
3. 1638 දී ලන්දේසීන් සමග ගිවිසුම්ගතවූ උඩරට රජු කවුරුන්ද?
4. එම ගිවිසුමේ අන්තර්ගත කරුණු දෙකක් ලියා දක්වන්න.
5. ක්‍රි.ව.1656 වර්ෂයේ ජෙනරල් පෙරාඩ් හල්ෆ්ට්ගේ දූත ගමනේදී ලන්දේසීන් රජුට ලබා දුන් ත්‍යාග මොනවාද?
6. දිවයිනේ ලන්දේසීන් යටතේ පාලනයවූ ප්‍රධාන කොටස් තුන නම් කරන්න.
7. ලන්දේසීන් විසින් හඳුන්වාදුන් නීති ක්‍රමය තුළ ඇතිවූ උසාවි තුනක් දක්වා ඒවාට පැවරුණ කාර්යයන් ලියා දක්වන්න.
8. ලන්දේසීන් සිය ආදායම ඉහළ නංවා ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් දක්වන්න.
9. ඉංග්‍රීසින් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ සාධක තුන කුමක්ද?
10. ඉංග්‍රීසින් උඩරට සමග ඇතිකරගත් දූත සබඳතාවල ප්‍රධානීන් වූයේ කවුරුන්ද?
11. 1796 සිට 1815 දක්වා උඩරට රාජධානිය යටත්කර ගැනීම දක්වා මුහුදුබඩ ප්‍රදේශ වල බ්‍රිතාන්‍ය පාලනයේ කැපී පෙනෙන අවස්ථා තුනක් ලියා දක්වන්න.
12. 1797 මුහුදුබඩ ප්‍රදේශයේ ඇතිවූ කැරැල්ලට බලපෑ හේතු තුනක් දක්වන්න.
13. 1815 උඩරට ගිවිසුමේ 5 වන වගන්තියේ අන්තර්ගතය කුමක්ද?
14. 1818 නිදහස් සටනට හේතු වූ ප්‍රධාන සාධකය හා තවත් කරුණු තුනක් ලියා දක්වන්න.
15. 1818 නිදහස් සටනේ නායකයින් තිදෙනෙක් ලියා දක්වන්න.
16. 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ සාධක තුනක් දක්වන්න.
17. 1848 නිදහස් සටනට බලපෑ බදු වර්ග තුනක් දක්වන්න.
18. 1848 නිදහස් සටනේ නායකයින් තිදෙනෙකු දක්වන්න.
19. බ්‍රිතාන්‍යයන් විසින් 1833 ඇති කළ කෝල්බෲක් කොමිසම් යෝජනා තුළ අන්තර්ගතවූ ආර්ථික ලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ පරිපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණ තුන බැගින් දක්වන්න.
20. කෝල්බෲක් යෝජනා තුළ වූ පෞද්ගලික ව්‍යාපාරික අරමුණුවලට ගැළපෙන ලෙස සකස් කළ ප්‍රතිපත්ති තුනක් දක්වන්න.

21. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට හඳුන්වාදුන් ආර්ථික බෝග මොනවාද?
22. තේ වගාවේ උන්නතියට බලපෑ හේතු සාධක තුනක් දක්වන්න.
23. රබර් වගාවේ දියුණුවට හේතු වූ කරුණු තුනක් දක්වන්න.
24. 1840 ඇති කළ මුඩුබිම් පනත යනු කුමක්ද?
25. සමූපකාර සමිති ආරම්භ කිරීම මගින් බලාපොරොත්තු වූ අරමුණු තුනක් දක්වන්න.
26. ලංකාවට පැමිණි මිෂනාරී සංවිධාන තුනක් ලියා දක්වන්න.
27. මිෂනාරීවරුන් ආගම ප්‍රචාරය කිරීමට අනුගමනයකළ ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද?
28. බෞද්ධ පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණ 04ක් ලියා දක්වන්න.
29. බෞද්ධ පුනරුදය තුළ එළිදැක්වූ බෞද්ධ ප්‍රකාශන තුනක් දක්වන්න.
30. හින්දු පුනර්ජීවනයේ පුරෝගාමියා වූයේ කවුරුන්ද?

- ලබන සතියේ සිට තුන්වන වාරය සඳහා අදාල විෂය ඒකක ආවරණය වන ලෙස පැවරුම් සකස් වේ.ඒ සඳහා ඔබ සූදානම් වන්න.

සැකසුම- .උදාර අරවින්ද-නිවිතිගල කලාපය-.(ර/නිවි/කලවාන ජාතික පාසල)